සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

# කතෝලික ධර්මය

**6 ශ්‍රේණිය** **කාලය පැය 2 යි.**

නම/ විභාග අංකයඃ

## I - කොටස

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. මැවිලි අතර උතුම්ම මැවිල්ල වන්නේ,
(1) අහස හා ජලය (2) දවාල හා රාත්‍රිය (3) ඉර හඳ තාරකා (4) මිනිසා

02. හතරවන දේව පනත වන්නේ කුමක් ද?
(1) ජීවිතය විනාශ නොකරව (2) කාම මිථ්‍යාචාරය නොකරව
(3) මව්පියන්ට සංග්‍රහ කරව (4) සොරකම් නොකරව

03. දෙව්පියාණන්ගේ සත්‍ය වූ ධර්මය ලොවට කියා දෙන්නට ඉදිරිපත් වූ අයෙකි,
(1) සතේපන් තුමා (2) ෆ්‍රැන්සිස්තුමා (3) අන්තෝනි තුමා (4) පාවුලු තුමා

04. ශුද්ධ වූ සභාවේ ශික්ෂා පද ගණන වන්නේ කීයද?
(1) පහයි. (2) හයයි. (3) හතයි. (4) දහයයි.

05. යාච්ඤා වර්ග කීයක් තිබේද?
(1) පහකි. (2) හතරකි. (3) තුනකි. (4) හතකි.

06. අපට දේව දරුකම ලැබෙන්නේ,
(1) අභිවෘද්ධි ආලේපය මඟිනි. (2) ප්‍රසාද ස්නාපනය මඟිනි.
(3) දිව්‍ය සත්ප්‍රසාදය මඟිනි. (4) සමගි සන්ධානය මඟිනි.

07. ප්‍රසාද ස්නාපනය ලැබූ දරුවකුට ලැබෙන උතුම්ම දීමනාව වන්නේ,
(1) ඉවසීමයි. (2) බලාපොරොත්තුවයි. (3) විශ්වාසයයි. (4) සතුටයි.

08. ජේසුස් වහන්සේ විසින් දිව්‍ය සත්ප්‍රසාදය ස්ථාපිත කරන ලද්දේ,
(1) මහ සිකුරාදාය (2) මහ බ්‍රහස්පතින්දාය (3) පාස්කු ඉරිදාය (4) ගොක් ඉරිදාය

09. සෑම දිව්‍ය පූජාවකදීම ප්‍රධාන ලෙස සිහි කරනු ලබන්නේ,
(1) ජේසුස් වහන්සේගේ ප්‍රාතිහාර්යයන් හා ඉගැන්වීමය.
(2) ජේසුස් වහන්සේගේ උපත හා උත්ථානයයි.
(3) ජේසුස් වහන්සේගේ දුක් විඳීම, මරණය හා උත්ථානයයි.
(4) ජේසුස් වහන්සේගේ උත්ථානයයි.

10. රදගුරුතුමා විසින් දානය කරනු ලබන ප්‍රසාද නිධාන වන්නේ,
(1) ප්‍රසාද ස්නාපනය හා පූජක වරය. (2) පූජකවරය හා දිව්‍ය සත්ප්‍රසාදය.
(3) අභිවෘද්ධි ආලේපය හා රෝගීන්ගේ ආලේපය. (4) අභිවෘද්ධි ආලේපය හා පූජකවරය.

11. ජේසුස් වහන්සේ අපට කියා දුන් උතුම්ම යාච්ඤාව වන්නේ,
(1) උදය ආරාධනාව. (2) විශ්වාස ලක්ෂණය. (3) ස්වාමිවාක් ආරාධනාව. (4) දයාධික මනස්ථාපය.

12. පළමු දේවපනත් තුනෙන් කියවෙන්නේ,
(1) දෙව්පියාට ගෞරව කිරීම ගැනය. (2) අසල්වැසියාවට ප්‍රේම කිරීම ගැනය.
(3) පිරිසිදු පැවැත්මෙන් ජීවත් වීම ගැනය. (4) බොරු සාක්ෂි කීමෙන් වැළකීම ගැනය.

13. යාච්ඤාවේ ප්‍රධාන කොටස් ගණන වන්නේ කීයද?
(1) තුනයි. (2) හතරයි. (3) පහයි. (4) හයයි.

14. ලූර්දු නුවර දී 1858 දී දේවමාතාවන් දර්ශනය වූයේ කාටද?
(1) බර්ණදෙත්ට (2) ජසින්තාට (3) දොමිනික් පියතුමාට (4) ලූසීට

15. දේව මාතාවන් ජන්ම දෝෂයෙන් නිර්දෝෂ ව පිළිසිඳීමේ මංගල්‍යය පවත්වනු ලබන්නේ කවදාද?
(1) අගෝස්තු 15 (2) දෙසැම්බර් 08 (3) ජනවාරි 01 (4) දෙසැම්බර් 25

16. ''නමෝ මරිය'' යාච්ඤාව කොටස් කීයකින් යුක්ත ද?
(1) තුනයි. (2) හතරයි. (3) හතයි. (4) දෙකයි.

17. ''අපෝස්තුලුවරුන්ගේ විශ්වාස'' ලක්ෂණයෙහි අඩංගු සත්‍යතා ගණන වන්නේ කීයද?
(1) දොළහකි. (2) දහයකි. (3) හතකි. (4) හයකි.

18. අලි අග්කා නමැති පුද්ගලයා මැරීමට තැත් කළේ මෙතුමාවය,
(1) ස්තේපන් තුමා (2) ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුලු මුනිතුමා
(3) ශුද්ධ වූ 23 වෙනි ලියෝ පාප්තුමා (4) ශුද්ධ වූ 12 වැනි පියුස් පාප්තුමා

19. ලෝකවාසී පව්කරුවන්ගේ සිත් හැරීම සඳහා මැදිහත් වන ලෙස දේව මාතාවන් පැවසූයේ,
(1) පිරිසිදු ජීවිතයක් ගත කළ ඇග්නස් තුමියටයි. (2) අසරණයන්ට සරණ වූ තෙරේසා මව්තුමිටයි.
(3) ජේසුගේ කුඩා මල වූ තෙරේසා තුමියටයි. (4) ලුසී, ෆ්‍රැන්සිස්, ජසින්තා යන ළමයින්ටයි.

20. පියතුමා පව් කමාව දානය කරන විට කියනු ලබන යාච්ඤාව වන්නේ,
(1) දයාධික මන්ථාපය (2) විශ්වාස ලක්ෂණය (3) ස්වාමිවාක් ආරාධනය (4) මංගල්‍ය ආරාධනය

- **ගැලපෙන සේ යා කරන්න.**

| | A | | B |
|---|---|---|---|
| 21. | කිතුතුමාගේ දුක්විඳීම, මරණය හා උත්ථානය | A | පස්වෙනි පනතිනි. |
| 22. | ක්‍රිස්තුන් වහන්සේ පරාජය කළේ | B | සමාව දිය යුතුය. |
| 23. | ජීවිතය විනාශ නොකරන ලෙස කියවෙන්නේ | C | පාස්කු අභිරහස ලෙස හැඳින්වේ. |
| 24. | දේව පනත් ගණන වන්නේ, | D | මරණයයි. |
| 25. | අපට සතුරුකම් කරන අයට අප | E | දහයකි |

- **නිවැරදි වචනය වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

26. බබිලෝනිය නම් රටේ ................................................................................ බලවන්ත රජෙක් සිටියා.
27. ඉරු දින දී අප අනිවාර්යයෙන්ම ........................................................................ සහභාගී විය යුතුය.
28. පූජකවරය දානය කරනු ලබන්නේ ............................................................................ විසිනි.
29. ජේසුස් වහන්සේ අප අතර .......................................................................... වැඩ සිටින සේක.
30. දෙවියන් වහන්සේ මිනිසා මැව්වේ තම ............................................................................ අනුවය.
31. අසිරිමත් මැවිල්ල දෙවියන් වහන්සේගේ ...................................................................... සංකේතයකි.
32. පූජකවරයකුගේ සේවාවක් වන්නේ ............................................................................ යි.
33. වසරකට වරක්වත් පාපොච්චාරණය කිරීම ............................................................................ කි.
34. දේව ජනතාවගේ ණය යුක්තියක් වන්නේ ............................................................................
35. දෙව් පියාට ස්තුති ප්‍රශංසා කිරීම ............................................................................ යි.
(ආදරයේ / රදගුරුතුමා / නෙබුකද්නෙශර් / දිව්‍ය පූජාවට / ස්වරූපය / ජීවමානව / ශු. සභාවේ ශික්ෂාපදයකි / ණය මංගල්‍ය දින හා ඉරු දින දිව්‍ය පූජාවට සහභාගි වීමයි / යාච්ඤාවයි)

- **ප්‍රශ්න අංක 36 - 40 දක්වා වූ ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

36. ප්‍රසාද නිධාන දානය කිරීමේදී සංකේත හා ද්‍රව්‍ය යොදා ගනියි. ( )
37. සබත් දින ලෙස අපි පිළිගන්නේ සෙනසුරාදා දිනයයි. ( )
38. ජේසුස් වහන්සේ දෙව්පියාට නිතරම යාච්ඤා කළ නොකළ සේක. ( )
39. පොදු යැදුමකි උදය ආරාධනාව. ( )
40. ''ස්වර්ගයේ වැඩ සිටින යාච්ඤාව'' පරමණ්ඩල යාච්ඤාව යනුවෙන්ද හැඳින්වේ. ( )

(ල. 40)

## II - කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

(01) යාච්ඤාව යන තේමාවට අදාළව අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
(1) යාච්ඤාව යනු කුමක් ද? (ල.02)
(2) ජේසුස් වහන්සේ අපට ඉගැන්වූ යාච්ඤාව කුමක් ද? (ල.02)
(3) ඔබ යාච්ඤා කරන අවස්ථා 04 ක් ලියන්න. (ල.03)
(4) ජේසුතුමා යාච්ඤා කළ අවස්ථා 03 ක්ලියන්න. (ල.03)
(5) ඔබට ලැබුණු දීමනා වලට ස්තුති කර යාච්ඤාවක් ලියන්න. (ල.02)

(02) (1) දේව පනත් වල 4, 5, 6 පනත් පිළිවෙලින් නම් කරන්න.
(2) එම පනත් වල අප කළ යුතු දේ හා නොකළ යුතු දේ ලියා දක්වන්න. (ල.12)

(03) (1) ශුද්ධ සභාවේ ශික්ෂාපද කීයද? ඒවා ලියා දක්වන්න.
(2) ඉන් එක් ශික්ෂා පදයක් ගැන කෙටියෙන් ලියන්න. (ල.12)

(04) (1) පරිසිවරයා හා අයකැමියා පිළිබඳ උපමා කතාව ලියන්න.
(2) ඉන් ඔබට ගත හැකි ආදර්ශයද ලියා දක්වන්න. (ල.12)

(05) (1) ගාබ්‍රියෙල් දේව දූතයා විසින් මරිය තුමියට මංගලම් කීම තුළින් නිර්මාණය වූ යාච්ඤාව නම් කරන්න.
(2) මරියතුමියගේ මංගල්‍ය තුනක් නම් කරන්න.
(3) මරිය තුමී ගැන කෙටියෙන් හැඳින්වීමක් කරන්න. (ල.12)